සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

පළමු වාර පරීක්ෂණය 2015

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I

11 ශ්‍රේණිය                                                                                    කාලය පැය 01 යි.

නම/ විභාග අංකයඃ

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01 සමාජයේ ක්‍රමික වර්ධනයත් සමග ව්‍යාපාර ආරම්භවීමට බලපෑ මූලික සාධකය වනුයේ,
(1) නිෂ්පාදනය හා බෙදාහැරීමය. (2) භාණ්ඩ හා සේවාය.
(3) අවශ්‍යතා හා වුවමනාය. (4) ඉල්ලුම හා සැපයුමය

02 වර්තමානයේ වෙළඳපොළෙන් භාණ්ඩ හා සේවා මිලට ගැනීමට හැකිවී ඇත්තේ,
(1) ප්‍රාථමික නිෂ්පාදනය නිසාය. (2) භාණ්ඩ හුවමාරුව නිසාය.
(3) ඍජු නිෂ්පාදනය නිසාය. (4) වක්‍ර නිෂ්පාදනය නිසාය

03 භාණ්ඩ හා සේවා සැසඳීමේ දී සේවාවක දැකිය හැකි ගතිලක්ෂණයක් වනුයේ,
(1) ඒකාකාරී වීමය. (2) ස්පර්ශ කළහැකි වීමය.
(3) ගබඩා කළ නොහැකි වීමය. (4) සපයන්නා අනුව වෙනස් නොවීමය.

04 වර්තමානයේ ඉතා දියුණු මට්ටමේ ඇති ව්‍යාපාරවල ආරම්භක අවස්ථාව ලෙස සැලකිය හැක්කේ,
(1) කාර්මික විප්ලවයයි. (2) භාණ්ඩ හුවමාරුවයි.
(3) පරිභෝජනය කිරීමේ අරමුණයි. (4) පරිභෝජනයට හිඟතාවයයි.

05 නිෂ්පාදිතයක් (Product) යන්නට වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,
(1) ආර්ථික භාණ්ඩය (2) අවශ්‍යතා හා වුවමනා ඉටුකරන ඕනෑම දෙයකි.
(3) භාණ්ඩ හා සේවාය(4) ස්වභාවික භාණ්ඩ හා සේවාය

06 ශ්‍රී ලංකා මහ බැංකුවේ දළ ජාතික නිෂ්පාදනය වර්ගීකරණය කර ඇති ආකාරයට සේවා නිෂ්පාදනයට පමණක් අදාළ වන කාණ්ඩය වනුයේ,
(1) ප්‍රවාහනය, බැංකු, රක්ෂණ, නිවාස අයිතිය, තොග හා සිල්ලර වෙළඳාම
(2) ප්‍රවාහනය, ගබඩා, කෘෂි, බැංකු, රක්ෂණ
(3) බැංකු, රක්ෂණ, ද්‍රව, විදුලිය හා ගෑස්
(4) බැංකු, රක්ෂණ, ප්‍රවාහන, කෘෂි හා නිවාස අයිතිය

07 විවිධ වාණිජ බැංකු තම ගනුදෙනුකරුවන්ට ඕනෑම බැංකු ශාඛාවකින් කටයුතු කිරීමට හැකිවන පරිදි විද්‍යුත් මාධ්‍ය ඔස්සේ සම්බන්ධතා ජාලයක් ගොඩනැගීම යන සංකල්පයෙන් අදහස් වන්නේ,
(1) ඒකීය බැංකු ක්‍රමයයි. (2) අන්තර් බැංකුකරණයයි.
(3) විද්‍යුත් වාණිජ්‍යයයි. (4) දුරකථන බැංකුකරණයයි.

08 නිෂ්පාදකයා නිපදවන ලද භාණ්ඩ හා සේවා බෙදාහැරීමේ ක්‍රියාවලියේ අතරමැදියකු ලෙස සැලකිය නොහැකි වන්නේ,
(1) පාරිභෝගිකයා ය. (2) නියෝජිතයා ය.
(3) සිල්ලර වෙළෙන්දා ය. (4) තොග වෙළෙන්දා ය.

09 පතල් හා කැනීම් නිෂ්පාදන අයත් වනුයේ,
(1) කෘෂිකාර්මික නිෂ්පාදනයට ය. (2) තෘතීයික නිෂ්පාදනයට ය.
(3) ප්‍රාථමික නිෂ්පාදනයට ය. (4) ද්විතීයික නිෂ්පාදනයට ය.

10 ව්‍යාපාරයක ඇති ශක්තීන් හා දුර්වලතා හඳුනාගැනීමට ඉවහල් වන සාධක වනුයේ,
(1) බාහිර පරිසරයයි (2) අභ්‍යන්තර පරිසරයයි
(3) ආර්ථික පරිසරයයි (4) නෛතික පරිසරයයි.

11 බැංකුව විසින් තැන්පතු සඳහා ලබාදෙන පොලී අනුපාතය මත රටක ඉතිරි කිරීම තීරණය වේ. මෙම ප්‍රකාශයෙන් හැඟවෙන ව්‍යාපාර පරිසර සාධකය වනුයේ,

(1) ප්‍රජා පරිසරයයි. (2) දේශපාලන පරිසරයයි.

(3) ආර්ථික පරිසරයයි. (4) සමාජ හා සංස්කෘතික පරිසරයයි.

12 පවනි විතානාරච්චි විසින් ''පවනි ස්ටෝර්ස්'' නමින් සිල්ලර වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මෙම ව්‍යාපාරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,

(1) මෙම ව්‍යාපාරය ලියාපදිංචිය අනිවාර්යය වේ.

(2) මෙම ව්‍යාපාරය ලියාපදිංචිය අනිවාර්යය නොවේ.

(3) මෙම ව්‍යාපාරයේ වගකීම සීමිත වේ.

(4) මෙම ව්‍යාපාරයට නෛතික පුද්ගලභාවයක් හිමිවේ.

13 කේවල ස්වාමි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාරවල දැකිය නොහැකි එහෙත් සීමිත සමාගම්වල දැකිය හැකි ලක්ෂණයක් වනුයේ,

(1) ආර්ථික කටයුත්තක යෙදීමය. (2) ලාභ ලැබීමය.

(3) පැවැත්මක් පැවතීමය. (4) නෛතික පුද්ගලභාවයක් පැවතීමය.

14 විශාල වශයෙන් මුදලක් අත නොමැති, නීතිරීති බැඳීම්වලට අකැමැති, ස්වාධීනව කටයුතු කරමින් පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමට කැමැති අජිත් වනිගසූරිය ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරගෙන සිටී. ඒ අනුව ඔහුට ආරම්භ කිරීමට සුදුසු ව්‍යාපාර සංවිධානය වනුයේ,

(1) සීමිත සමාගම් ව්‍යාපාරය (2) හවුල් ව්‍යාපාරය

(3) තනි පුද්ගල ව්‍යාපාරය (4) සමිති සංවිධාන ව්‍යාපාරය

15 ව්‍යාපාර සංවිධාන ලියාපදිංචි කිරීමේ දී ඉදිරිපත් කළ යුතු ලියවිලි අතර සාමාජික මුදල් පරිහරණය පිළිබඳ වාර්තාවක් අවශ්‍යය වනුයේ කුමන ව්‍යාපාර සංවිධානයකට ද?

(1) සංස්ථාපිත සමාගමකටය (2) සමූපකාර සමිතියකටය

(3) සමිති ව්‍යාපාරයකටය (4) හවුල් ව්‍යාපාරයකටය

16 නිෂ්පාදන ආයතනයක් සම්බන්ධයෙන් කම්හල් පොදු කාර්ය පිරිවැය සමන්විත වනුයේ,

(1) ඍජු ද්‍රව්‍ය හා වක්‍ර ද්‍රව්‍ය පිරිවැයෙනි. (2) ඍජු ද්‍රව්‍ය හා ඍජු ශ්‍රම පිරිවැයෙනි.

(3) වක්‍ර ද්‍රව්‍ය හා වක්‍ර ශ්‍රම පිරිවැයෙනි. (4) ප්‍රාථමික පිරිවැය නොවන පිරිවැයෙනි.

17 නව ව්‍යාපාරිකයකු තම ව්‍යාපාරික කටයුතු පහසුකර ගැනීම සඳහා චෙක්පත් භාවිතා කිරීමට අදහස් කරයි. එසේ චෙක්පත් නිකුත් කිරීමට හැකියාව ලබාදෙන බැංකු ගිණුම වනුයේ,

(1) ස්ථාවර තැන්පතු (2) ඉල්ලුම් තැන්පතු

(3) කාලීන තැන්පතු (4) ඉතිරි කිරීමේ තැන්පතු

18 යොදාගත් තාක්ෂණය මත ශ්‍රම සූක්ෂම ලෙස හැඳින්විය හැක්කේ,

(1) ශ්‍රමයට සාපේක්ෂව යන්ත්‍ර උපකරණ වැඩිපුර යොදාගැනීම.

(2) ශ්‍රමයට සාපේක්ෂව යන්ත්‍ර උපකරණ අඩුවෙන් යොදාගැනීම.

(3) ප්‍රාග්ධනයට සාපේක්ෂව යන්ත්‍ර උපකරණ වැඩියෙන් යොදාගැනීම.

(4) යන්ත්‍ර උපකරණ හා ශ්‍රමය සම සමව යොදාගැනීම.

19 ප්‍රතික්‍රියා දැක්වීමට හැකියාව ඇති පුහුණුව තුළින් වඩා සංවර්ධනය කළහැකි ව්‍යාපාරයක් සතු වටිනා සම්පතක් වනුයේ,

(1) පරිගණක පද්ධතිය (2) ශබ්ද විකාශන පද්ධතිය

(3) සේවක මණ්ඩල පද්ධතිය (4) රූපවාහිනී පද්ධතිය

20 මෙහෙයුම් සැලැස්මේ පමණක් ඇතුළත් කරනු ලබන අයිතමය වනුයේ,

(1) ඇස්තමේන්තුගත විකුණුම් (2) ඇස්තමේන්තුගත ලාභය

(3) ඇස්තමේන්තුගත ස්ථාවර වත්කම් (4) ඇස්තමේන්තුගත අමුද්‍රව්‍ය පිරිවැය

21 ව්‍යාපාරයක මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය වන කෙටිකාලීන පිරිවැය වත්කම් පමණක් අඩංගු වන පිළිතුර වනුයේ,

(1) තොගය, ණයගැතියෝ, යන්ත්‍ර, මුදල්

(2) තොගය, ණයගැතියෝ, බැංකු ශේෂය, මුදල් ශේෂය

(3) තොගය, ණයගැතියෝ, ලී බඩු, මුදල්

(4) තොගය, ණයගැතියෝ, උපකරණ, මුදල් ශේෂය

22 වාණිජ බැංකුවකින් අයිරා ණයපත් ලබාගැනීමේ පහසුකම පවතින්නේ,

(1) ඕනෑම ගිණුමක් හිමි අයෙකුට (2) ජංගම ගිණුමක් හිමි අයෙකුට

(3) ඉතුරුම් ගිණුමක් හිමි අයෙකුට (4) ස්ථාවර ගිණුමක් හිමි අයෙකුට

23 පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) චෙක්පතක අණ ලද්දා සැමවිටම වාණිජ බැංකුවකි.

(2) රේඛණය කරන ලද චෙක්පතකට බැංකු කවුන්ටරයෙන් මුදල් ලබාගත හැක.

(3) චෙක්පත් මගින් ගෙවීම් කිරීමට බැංකු ජංගම ගිණුමක් අවශ්‍ය නොවේ.

(4) චෙක්පතක් රේඛනය කළ හැක්කේ අණ ලද්දාට පමණි.

24 වාණිජ බැංකු නොවන තැන්පතු භාරගන්නා මූල්‍ය ආයතනයකි

(1) කල්බදු සමාගම (2) වණික් බැංකුව

(3) සංවර්ධන බැංකුව (4) මුදල් තැරැව්කාර සමාගම්

25 රක්ෂිතයාට රක්ෂණ සමාගමෙන් හැර වෙනත් පාර්ශවවලින් වන්දි ලබාගැනීම වළක්වන රක්ෂණ මූලධර්මය කුමක් ද?

(1) උපරිම විශ්වාසය (2) හානිපූරණය (3) දායකත්වය (4) ආදේශනය

26 පහත දැක්වෙන්නේ සන්නිවේදන මාධ්‍යය හා සන්නිවේදන ක්‍රම කිහිපයකි.

| සන්නිවේදන මාධ්‍යය | | සන්නිවේදන ක්‍රමය | |
|---|---|---|---|
| 1 | වාචික | A | වාර්තා |
| 2 | ලිඛිත | B | ගුවන් විදුලිය |
| 3 | විද්‍යුත් | C | වැඩමුළු |

ඉහත සන්නිවේදන මාධ්‍යයන් සඳහා අදාළ සන්නිවේදන ක්‍රම නිවැරදි අනුපිළිවෙළින් ගැලපූවිට ලැබෙන පිළිතුර වනුයේ,

(1) C, B, A ය. (2) A, B, C ය. (3) C, A, B ය. (4) B, A, C ය.

27 සන්නිවේදනය යනු,

(1) එක් ස්ථානයක ඇති තොරතුරු තවත් ස්ථානයකට ලබාදීමය.

(2) දත්ත එක්රැස් කර තොරතුරු බවට පත්කිරීමය.

(3) සියලුම කරුණු එක් ස්ථානයක රැස්කිරීමය.

(4) දත්ත පරිගණකය මගින් සකස්කිරීමය.

28 මාර්ගය, මාධ්‍යය, බලය, පර්යන්තය යන ප්‍රවාහනයේ මූලිකාංග සඳහා නිදසුන බැගින් දැක්වෙන පිළිතුර වනුයේ,

(1) බස් නැවතුම්පොළ, මහා මාර්ග, ගෑස්, විදුලිය

(2) ගුවන් මාර්ග, ගුවන් යානා, ඛණිජ තෙල්, ගුවන් නැවතුම්පොළ

(3) විදුලිය, දුම්රිය, ගෑස්, දුම්රිය නැවතුම්පොළ

(4) ගුවන් මාර්ග, විදුලිය, ගෑස්, දුම්රිය

29 ව්‍යාපාරික ආයතනයකට ක්‍රමවත් ගබඩාකරණයක් පවත්වා නොගැනීම නිසා විවිධ දුෂ්කරතාවලට මුහුණදීමට සිදුවේ. එසේ සිදුවන දුෂ්කරතාවයක් විය නොහැක්කේ,

(1) ව්‍යාපාරික කටයුතු අඩපණ වීම.

(2) ගනුදෙනුකරුවන් කළකිරීම.

(3) ආයතනයේ කීර්තිනාමය පලුදු වීම.

(4) සුදුසු ආරක්ෂණ විධිවිධාන පවත්වා ගැනීම.

30 වැඩිවීම හර අඩුවීම බැර මූලධර්මයට ගැළපෙන්නේ,

(1) වත්කම් හා වගකීම් ගිණුම්ය. (2) හිමිකම් හා ආදායම් ගිණුම්ය.

(3) වත්කම් හා වියදම් ගිණුම්ය. (4) වත්කම් හා ආදායම් ගිණුම්ය.

31 ගැනුම් ජ'නලයේ සටහන් කිරීමට උපයෝගී කරගන්නා මූලික ලියවිල්ල වනුයේ,

(1) බැරපත (2) හරපත (3) ඉන්වොයිසිය (4) වවුචරය

32 ව්‍යාපාරයකට මුදල් ලැබීමකදී භාවිතා කරන ලදුපත

(1) මූලාශ්‍ර ලේඛනයකි. (2) ලෙජර් ගිණුමකි.

(3) ජ'නලයකි. (4) මූලික සටහන් පොතකි.

33 ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා ජනහිත සමාගමෙන් ලී බඩු ණයට ගැනීම සටහන් කළ යුතු මූලික සටහන් පොත වනුයේ,

(1) මුදල් පොතයි. (2) පොදු ජ'නලයයි. (3) ගැනුම් ජ'නලයයි. (4) ගැනුම් ගිණුමයි.

34 ව්‍යාපාරය සමන්තිකාට විකුණන ලද භාණ්ඩ වලින් රු. 4000/ වටිනා භාණ්ඩ ආපසු හරවා එවන ලදී. මෙය සටහන් කිරීමට අවශ්‍ය වන මූලාශ්‍ර ලේඛනය වනුයේ,

(1) ඉන්වොයිසිය (2) ලදුපත (3) හරපත (4) බැරපත

35 2014 ජනවාරි සුළු මුදල් භාරකරුට දුන් අග්‍රිමය වනුයේ රු. 3500/ කි. මාසය අවසානයේ පැවැති සුළු මුදල් වශයෙන් අත ඉතිරි ශේෂය වූයේ රු. 250 කි. ඉදිරි මාසය සඳහා සුළු මුදල් වශයෙන් ප්‍රතිපූරණය කළ යුතු වන්නේ,

(1) රු. 3500/ කි. (2) රු. 250/ කි. (3) රු. 3250/ කි. (4) රු. 3750/ කි.

36 ගිණුම්කරණ සමීකරණය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) අයිතිකරුගේ ප්‍රාග්ධනය පවතින විට වත්කම්වල වටිනාකම වගකීම්වලට සමාන වේ.

(2) අයිතිකරුගේ ප්‍රාග්ධනයෙන් වගකීම් අඩුකළ පසු ලැබෙන වටිනාකම ව්‍යාපාරයේ වත්කම්වලට සමාන වේ.

(3) බැංකු ණයක් ලබාගෙන ඇතිවිට වත්කම්වල වටිනාකම අයිතිකරුගේ ප්‍රාග්ධනයට සමාන වේ.

(4) වත්කම්වල වටිනාකමෙන් වගකීම්වල වටිනාකම අඩුකළ පසු අගය අයිතිකරුගේ ප්‍රාග්ධනය වේ.

37 ව්‍යාපාරයක සියලුම ගිණුම් ඇතුළත් කර ඇති ලේඛණය හඳුන්වන්නේ,

(1) මූලික පොත වශයෙනි. (2) ජ'නලය වශයෙනි.

(3) ලෙජරය වශයෙනි. (4) මුදල් පොත වශයෙනි.

- ජනකගේ ව්‍යාපාරයේ 2014. 12. 31 දිනට පිළියෙල කළ මුදල් පොතේ බැංකු තීරුවල ශේෂය රු. 7000/ ක් විය. එදිනට ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය මෙයට වෙනස් විය. වෙනසට හේතුව පහත කරුණු මගින් අනාවරණය විය.
    - ඍජු ප්‍රේෂණ රු. 4000 පැවතුනි. ස්ථාවර නියෝග රු. 2000 විය.
    - තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් රු. 8000 පැවතීම දක්නට ලැබුණි.

38 ඉහත තොරතුරුවලට අනුව මුදල් පොතේ සංශෝධිත ශේෂය වනුයේ,

(1) රු. 7000/ (2) රු. 15000/ (3) රු. 9000/ (4) රු. 11000/

39 බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කළවිට ලැබෙන බැංකු ප්‍රකාශයේ ශේෂය වනුයේ,

(1) රු. 8000/ (2) රු. 9000/ (3) රු. 7000/ (4) රු. 1000/

40 ත්‍රිත්ව තීරු මුදල් පොතක හර පැත්තේ ඇති වට්ටම් තීරුවේ එකතුව සටහන්

(1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## පළමු වාර පරීක්ෂණය 2015

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II

11 ශ්‍රේණිය කාලය පැය 02 යි.

නම/ විභාග අංකය:

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. A කොටසින් ප්‍රශ්න 02 ක් ද, B කොටසින් ප්‍රශ්න 02 ක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 කේක් සෑදීම සහ අයිසිං මල් සැකසීමේ කාර්යයේ කලක් යෙදී සිටි නන්දා 2015 ජනවාරි 15 දින නන්දා කේක් හවුස් නම් ස්ථානයේ වැඩ ආරම්භ කරන ලදී. මෙයට පෙර කේක් සහ අයිසිං මල් සෑදීමට ලබාගෙන තිබූ කඩකාමරය ඉදිරිපස කොටසද සමග රු. 300,000 කට ඇය මිලට ගන්නා ලදී. ඇය ඉතිරි කර තිබූ මුදල්වලින් තව 50000 ඉතිරිව තිබූ බැවින් මේස හා රාක්ක මිලදී ගැනීමට යොදවන ලදී. බැංකුවෙන් රු. 100000 ක ණය මුදලක් ලබාගෙන රු. 50000 යොදා කේක් සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලට ගන්නා ලදී.

(1) මෙම ව්‍යාපාරය මගින් ඉටුකරන මිනිස් අවශ්‍යතාව සඳහන් කරන්න.

(2) නන්දාගේ මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධානයකට අයත්වේ ද?

(3) මෙම ව්‍යාපාර සංවිධානයේ වාසි දෙකක් සඳහන් කරන්න.

(4) මෙම ව්‍යාපාර සංවිධානය සම්බන්ධ අවාසි දෙකක් සඳහන් කරන්න.

(5) මෙම ව්‍යාපාරය ලියාපදිංචි කරයි නම් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමෙන් අත්වන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.

(6) මෙම ව්‍යාපාරයෙහි තොරතුරු අධ්‍යයනය කර ආරම්භක තොරතුරු මූලික ගිණුම්කරණ සමීකරණය ලියා එයට වටිනාකම් ආදේශ කරන්න.

(7) මෙහි ආරම්භක ගනුදෙනු අනුව ව්‍යාපාරය අත්පත් කරගෙන ඇති ජංගම නොවන වත්කම් දෙකක් ලියන්න.

(8) මෙහි ගනුදෙනු සටහන් කිරීමට අවශ්‍ය මූලික සටහන් පොත් දෙකක් නම් කරන්න.

(9) මුදල් ලැබීම් හා ගෙවීම් සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛන මොනවා ද?

(10) මෙම ගනුදෙනු සිදුවීමෙන් පසු අත ඉතිරි වූ මුදල් ශේෂය කොපමණ ද?

(2 x 10 = 20)

## A කොටස

02 (1) කාර්ය විශේෂීකරණය / පුද්ගල විශේෂීකරණය යනු කුමක් ද?

(2) භාණ්ඩ හුවමාරු ක්‍රමයේ පැවැති දුර්වලතා දෙකක් ලියන්න.

(3) වක්‍ර නිෂ්පාදනය යන්න විස්තර කරන්න.

(4) විවිධ ව්‍යාපාර සංවිධානවල පොදු ලක්ෂණ 4 ක් ලියන්න.

(5) ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම තුළින් ලබාගත හැකි ප්‍රයෝජන 2 ක් සඳහන් කරන්න. (2 x 5 = 10)

03 (1) නිෂ්පාදනයක පිරිවැය දැනගැනීමෙන් ආයතනයකට අත්පත් කර ගත හැකි ප්‍රයෝජන 2 ක් සඳහන් කරන්න.

(2) මුද්‍රණාලයක් පවත්වාගෙන යන ආරියතිලක මහතාගේ දියණිය ඖෂධවේදී පාඨමාලාව අවසන් කර සහතික ලබා ඇති බැවින් ඉංග්‍රීසි බෙහෙත් ද්‍රව්‍ය අලෙවියට ස්ථානයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. මෙම ව්‍යාපාර දෙකම නීතිගත කිරීමට ලියාපදිංචි කළ යුත්තේ කුමන ආයතනවලින්දැයි විමසා සිටියි. පැහැදිලි කර දෙන්න.

(3) සීමිත සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය වන ලියවිලි දෙකක් සඳහන් කරන්න.

(4) සමුපකාර සමිති ව්‍යාපාරවල දැකිය හැකි මූලික ලක්ෂණ 2 ක් සඳහන් කරන්න.

(5) වාණිජ බැංකු නොවන තැන්පතු භාරගන්නා මූල්‍ය ආයතන නම් කරන්න. (2 x 5 = 10)

04 (1) වාණිජ බැංකුවක ජංගම ගිණුමක් පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරිකයෙකුට ලැබිය හැකි වාසි හතරක් සඳහන් කරන්න.

(2) ව්‍යාපාර කටයුතුවලට සන්නිවේදනය ඉතා වැදගත් වේ. එසේ වැදගත් වීමට හේතු දෙකක් සඳහන් කරන්න.

(3) ක්‍රමවත් ගබඩාකරණ පද්ධතියක් නොමැති වුවහොත් ව්‍යාපාරිකයකුට සිදුවිය හැකි අහිතකර ප්‍රතිඵල හතරක් සඳහන් කරන්න.

(4) රක්ෂණ ගිවිසුමක් යනු කුමක්දැයි හඳුන්වන්න. එම ගිවිසුමට දායක වන පාර්ශව නම් කරන්න.

(5) ව්‍යාපාරයක් සුදුසු ප්‍රවාහන ක්‍රමයක් තෝරාගැනීමේ දී සලකා බලන සාධක 4 ක් ලියන්න. (2 x 5 = 10)

## B කොටස

05 A 2015. 02. 01දින මයන්ත රු. 100000 යොදා ව්‍යාපාරයක් ආරම්භ කර පළමු සතිය තුළ පහත ගනුදෙනු සිදුකර ඇත.

2015. 02. 02 විකිණීම සඳහා රු. 10000 ක බඩු තොගයක් අත්පිට මුදලට ගැනීම

2015. 02. 02 ලී බඩු ව්‍යාපාරයේ ප්‍රයෝජනයට මිලට ගත්තා රු. 8000

2015. 02. 03චාමරගෙන් රු. 4000 භාණ්ඩ ගත්තා

2015. 02. 04 රු. 8000 භාණ්ඩ අත්පිට මුදලට විකිණූ අතර ගාමිණීට රු. 5000 භාණ්ඩ විකුණන ලදී.

2015. 02. 05විදුලි බිල ගෙව්වා රු. 2500

රු. 7000 මුදල් බැංකුවේ තැන්පත් කළා.

2015. 02. 06 චාමරට රු. 2000 ගෙවූ අතර ගාමිණීගෙන් රු. 3000 ලැබුනා.

2015. 02. 07 කඩකාමර කුලී ගෙව්වා රු. 3000

දුරකථන බිල ගෙව්වා රු. 1500

ඔබ විසින් 2015. 02. 07 දින මයන්තගේ ව්‍යාපාරයේ අත ඉතිරි මුදල කොතෙක්දැයි ගණනය කරදීමට මුදල් ගිණුම පිළියෙල කරන්න. (ල . 05)

B ව්‍යාපාරයක් විසින් සිදුකළ ගනුදෙනු කිහිපයකට අදාළ හර හා බැර කරන ලද ජ'නල් සටහන් කිහිපයක් පහත දක්වේ.

1 මුදල් ගිණුම හර ප්‍රාග්ධන ගිණුම බැර

2 ලී බඩු ගිණුම හර ණයහිමි ගිණුම බැර

3 මුදල් ගිණුම හර ණයගැති ගිණුම බැර

4 ණයහිමි ගිණුම හර මුදල් ගිණුම බැර

5 මුදල් ගිණුම හර බැංකු ණය ගිණුම බැර

ඔබ විසින්,

(1) ඉහත ගිණුම්වල සටහන් කර ඇති ගනුදෙනුව වචනයෙන් ලියන්න.

(2) එම සටහන් කර ඇති ගනුදෙනු වත්කම් = ප්‍රාග්ධනය + වගකීම් යන ගිණුම්කරණ සමීකරණය තුළ අඩුවේ ද? වැඩිවේ ද යන්න සඳහන් කරන්න. (ල. 05)

06 A 2015. 01. 31 දිනට නිලූෂිගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමට අනුව ශේෂය රු. 12000 එදිනට බැංකුවෙන් ලැබී තිබූ ගිණුම් ප්‍රකාශයට අනුව මෙයට වෙනස් විය. එයට හේතු මෙසේය.

1. ජනවාරි මාසයේ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක් රු. 8000 කි.

2. ජංගම ගිණුමට හර කර ඇති නමුත් බැංකු ගිණුමේ සටහන් නොවූ බැංකු ගාස්තු රු. 850 කි.

3. බැංකුවට ලැබී ඇති සෘජු ප්‍රේෂණ රු. 5000 කි.

4. ජනවාරි මාසයේ නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 6500 කි.

ඒ අනුව,

(1) 2015. 01. 31 දිනට සංශෝධිත බැංකු ගිණුම හා (ල. 04)

(2) 2015. 01. 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය සකස් කරන්න. (ල. 04)

B බැංකුවක පවත්වාගෙන යන ජංගම ගිණුමක් සම්බන්ධ අයකරන ගාස්තු හතරක් සඳහන් කරන්න. (ල. 02)

07 A ලසන්තගේ ව්‍යාපාරයේ 2015. 01. 01 සිට 2015. 01. 07 දක්වා සුළු මුදල් වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| 2015. 01. 01 | දිනට සුළු මුදල් අත ඉතිරි මුදල | | රු. 350 |
| | අග්‍රිමය ප්‍රතිපූරණය කළා | | රු. 2150 |
| | ගමන් වියදම් ගෙව්වා වවුචර් අංක 1 | | රු. 150 |
| 2015. 01. 02 | විදුලි පණිවිඩ ගාස්තු | වවුචර් අංක 2 | රු. 80 |
| | තැපැල් හා මුද්දර ගාස්තු | වවුචර් අංක 2 | රු. 200 |
| 2015. 01. 03 | සංග්‍රහ වියදම් | වවුචර් අංක 4 | රු. 250 |
| | ගමන් ගාස්තු | වවුචර් අංක 5 | රු. 300 |
| | ලිපි ද්‍රව්‍ය | වවුචර් අංක 6 | රු. 210 |